**ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නි,ධාරීගේ හා ගණන්දීමේ නිළධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 18 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම් ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.20 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබූ බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128 ප්‍රකාරව ගණන්දීමේ නිළධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිළධාරි එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණභාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම. | 2.3.1 |
| | | 2. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම. | 2.3.2 (ආ) |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු. | 2.3 |
| | | 4. අනාර්ථික ගනුදෙනු. | 2.7 |
| | | 5. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.17 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලයදීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු. | 2.3 |
| | | 2. මහජනයා සඳහා සේවා ඉටු කිරිමේ අඩුපාඩු. | 2.10 |

| | | | |
|---|---|---|---|
| | ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | | |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.<br>2. අනුකූල නොවීම. | 2.17<br>2.18 |
| 128 (1) (ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.13 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | 1. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු<br>2. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු | 2.4<br>2.4 (ඊ) |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස ඉදිරිපත් කර නොතිබීම.<br>2. වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල නොකිරීම. | 2.2.1<br>2.2.3 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම. | 2.13 (අ) |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව | 1. අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම.<br>2. අනාර්ථික ගනුදෙනු. | 2.2.2 (ආ)<br>2.7 |

| | | | |
|---|---|---|---|
| | තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව. | | |
| 128(1)(ග) | ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තබන බව. | අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු. | 2.20 |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව. | පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම. | 2.4 (ඌ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන්

(අ) රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් යෙදවීමට අදාළ විධිවිධාන සැලැස්වීම.

(ආ) කෘෂිකාර්මික ඉඩම් හිමියන්, කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවීන් සහ භුක්තිකරුවන් සහ අඳ ගොවීන්ගේ වගා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

(ඇ) ගොවි සංවිධාන ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධ නියෝග සෑදීම සහ එම විධිවිධාන ක්‍රියාත්මක වීම තහවුරු කිරීම.

(ඈ) ගොවිජන සංවර්ධන සභා ස්ථාපිත කිරීම සහ ඒවායේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම සහ අධීක්ෂණය.

(ඉ) දිවයින පුරා පවත්නා සෑම ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයකටම අදාළව කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුළත් කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛන පිළියෙල කර සංශෝධනය හා ප්‍රතිශෝධනය කර පවත්වාගෙන යාම.

(ඊ) කෘෂිකාර්මික ඉඩම්වලට අදාළ අඳගොවි ගැටළු සහ වෙනත් ගොවි ආරවුල් විසඳීම සඳහා කටයුතු කිරීම.

(උ) සුළු වාරි කර්මාන්ත සහ ජල ප්‍රභවයන්ගේ ඵලදායීතාවය, ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකරණයට අදාළ වන විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

(ඌ) ගොවිජන සංවර්ධන පනත හා රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති උල්ලංඝනය කරමින් ක්‍රියාත්මක වන පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියා මාර්ග ගැනීම.

## 2.2 කාර්යසාධනය

----------------

### 2.2.1 සැලැසුම් කිරීම

----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ක්‍රියාකාරී සැලැස්මේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ගොවිජන සේවා මධ්‍යස්ථාන නව ඉදිකිරීම් හා දිස්ත්‍රික් කාර්යාල අලුත්වැඩියාව යටතේ රු. 23,702,110 ක වියදමකින් සිදු කර තිබූ ව්‍යාපෘති 10 ක් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව නොතිබුණි.

### 2.2.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයභාරයන් ඉටු නොකිරීම**

-----------------------------------------------------------------

ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියාව යටතේ ව්‍යාපෘති 06 ක්, දිස්ත්‍රික් කාර්යාල අලුත්වැඩියාව යටතේ ව්‍යාපෘති 04 ක් සඳහා හා නව ඉදිකිරීම් යටතේ කළුතර දිස්ත්‍රික්කය සඳහා සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.මිලියන 27 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් 2018 ජුනි 30 දින වන විටත් එම ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

-------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ කුඩා වැව් පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණ වැඩසටහනේ ක්‍රියාකාරකම් 04 ක් යටතේ වැව් 558 ක් සඳහා රු. මිලියන 918 ක් ද, සුළු වාරිමාර්ග හා පුරන් කුඹුරු සංවර්ධන වැඩසටහනේ ක්‍රියාකාරකම් 04 ක් යටතේ අමුණු 500 ක් සඳහාද රු. මිලියන 593 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් වැව් 247 ක් හා අමුණු 235 ක් වැඩ ආරම්භ කර රු. මිලියන 965.1 වැය කර තිබුණි. ඒ අනුව වැව් 311 ක් හා අමුණු 265 ක් වැඩ ආරම්භ කර නොතිබුණි.

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් වැඩ අවසන් නොවූ ව්‍යාපෘති**

-------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති වෙනුවෙන් දිස්ත්‍රික් කාර්යාල සඳහා මුදල් නිදහස් කර තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

(i) සමාලෝචිත වර්ෂයේ කුඩා වැව් පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ව්‍යාපෘති 1,184 ක් සඳහා 2017 දෙසැම්බර් 31 දිනට රු. 627,155,011 ක් වියදම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම ව්‍යාපෘති අවසන් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සුළු වාරිමාර්ග හා පුරන් කුඹුරු සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 437 ක් සඳහා 2017 දෙසැම්බර් 31 දිනට රු. 164,904,313 ක් වියදම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම ව්‍යාපෘති අවසන් කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ භෝග විවිධාංගීකරණය වැඩසටහන යටතේ ව්‍යාපෘති 628 ක් සඳහා 2017 දෙසැම්බර් 31 දිනට රු. 1,500,000 ක් වියදම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල දී මෙම ව්‍යාපෘති අවසන් කල යුතු වුවත් එසේ කර නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන අළුත්වැඩියාව යටතේ ව්‍යාපෘති 15 ක්

සඳහා 2017 දෙසැම්බර් 31 දිනට රු. 20,945,629 ක් වියදම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල දී මෙම ව්‍යාපෘති අවසන් කල යුතු වුවත් එසේ කර නොතිබුණි.

### 2.2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 අගෝස්තු 09 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. එසේම 2016 වර්ෂයේ කාර්යසාධන වාර්තාවද පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

### 2.3.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජල මිනුම් උපකරණ මිලදී ගැනීම සඳහා 2017 දෙසැම්බර් 26 දින රු. 700,000 ක් ගෙවා තිබුණද, එම භාණ්ඩ ආයතනයට ලැබී තිබුණේ 2018 වර්ෂයේදීය. එසේ වුවත් එම භාණ්ඩ 2017 වර්ෂයේ ලැබුණු සේ සලකා ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 අනුව එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් වෙත පමණක් බදු ගෙවිය යුතු වුවත්, රු. 740,025 වටිනා පෝස්ටර් මුද්‍රණය කිරීමේදී ඉන්වොයිස් පත්‍රයේ එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවෙකුට රු.96,525 ක් එකතු කල අගය මත බදු ලෙස ගෙවා තිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම් ලේඛනගත කිරිම**

2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් සෑම ආයතනයකින් වත්කම් සම්බන්ධයෙන් තොරතුරු කැඳවා තිබුණද, දෙපාර්තමේන්තුව විසින් එම තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වාහන 158 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

**(ඇ) කාර්යාල පවත්වා ගැනීමේ වියදම්**

වාර්ෂික පිරිසිදු කිරීමේ ගාස්තුව රු.14,313,795 ක්ද, ආරක්ෂක සේවා ගාස්තුව රු.8,229,800 ක්ද හා වරිපනම් ගාස්තු රු.924,244 ක්ද වශයෙන් සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ

මුළු ගොඩනැගිලි වෙනුවෙන් රු.23,467,839 ක වියදම් දරා තිබුණි. ඒ අනුව ඒක පුද්ගල කාර්යාලය පවත්වා ගෙනයාමේ වියදම රු.1,665 ක් වී තිබුණි. මේ පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආරක්ෂක සේවා ගිවිසුමේ අංක 05 ජේදය ප්‍රකාරව ආරක්ෂක නිලධාරියෙකු පැය 24 කට වඩා වැඩියෙන් සේවයේ නොයෙදිය යුතු බව දක්වා තිබුණද, ඊට පටහැනිව නිලධාරීන් 03 දෙනෙකු පැය 84 සිට පැය 240 දක්වා කාල පරාසයක් තුළ අවස්ථා 11 කදී සේවයේ යොදවා තිබූ බව නියැදි පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.
(ii) පිරිසිදු කිරීමේ සේවා ගිවිසුම අනුව දිනකට සිටිය යුතු අවම සේවක සංඛ්‍යාව 09 දෙනෙකු වුවද, ජූලි මස සිට දෙසැම්බර් මස දක්වා නියමිත සේවක සංඛ්‍යාවට වඩා අඩුවෙන් සේවයේ යෙදවීම නිසා රු.77,698 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**(ඈ) අපහරණය කළ යුතු වත්කම් අපහරණය නොකිරීම**

-----------------------------------------------------

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව වර්ෂයකට වැඩි කාලයක සිට අපහරණය කළ යුතු බවට තීරණය කර තිබුණු එක්ස්කැවේටර් යන්ත්‍රය, බුල්ඩෝසර් 09, ඩෝසර් 02 , වයිබ්‍රේටින් රෝලර් 01 ක් හා රු.15,300,000 ක පිරිවැය වූ වාහන 12 ක් 2018 ජූලි 31 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **වත්කම් වර්ගය** | **ඒකක ගණන** | **වටිනාකම** | **නිෂ්ක්‍රීයව පැවති කාලය** |
|---|---|---|---|---|
| | | | **රු.** | **(වර්ෂ)** |
| (i) | එස්කැවේටර් | 01 | - | 01 |
| (ii) | බුල්ඩෝසර් | 06 | - | 01 |
| (iii) | වයිබ්‍රේටින් රෝල් | 02 | - | 01 |
| (iv) | ලෝඩර් | 01 | - | 01 |
| (v) | යන්ත්‍ර | 13 | - | 01 මාස 07 |
| (vi) | වාහන | 08 | 24,300,000 | 01 |

**(ඊ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-----------------------------------------

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් කාර්යාල 05 ක සමාලෝචිත වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2018 සැප්තැම්බර් 12 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(උ) බාහිර පාර්ශව වෙත දී ඇති වත්කම්**

--------------------------------------

දෙපාර්තමේන්තුව සතු වාහන 03 ක් ප්‍රාදේශිය ලේකම් දකුණු පළාත, කෘෂිකර්ම අමාත්‍යාංශය හා හුණුපිටිය පොහොර ලේකම් කාර්යාලය වෙත වර්ෂයකට අධික කාලයක් මුදා හැර තිබුණු අතර, එය පවරා දීමට හෝ ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ)	වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

(i) කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාහන 03 ක්ද, ලෝක ආහාර ව්‍යාපෘතියේ වාහන 03 ක්ද, යාපනය හා මන්නාරම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාහන 02 ක්ද, මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 01 ක්ද, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වාහන 01 ක්ද පවරා ගැනීමකින් තොරව වර්ෂයකට අධික කාලයක සිට දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

(ii) ලෝක ආහාර වැඩසටහනෙන් සුනාමි ආධාර යටතේ දෙපාර්තමේන්තුව වෙත 2011 වර්ෂයේදී ලැබී තිබුණු ප්‍රාඩෝ ජීප් රථය ලියාපදිංචි කර නොතිබුණු අතර, එය මාලඹේ රථ වාහන අංගනයේ පාවිච්චියට නොගෙන ගාල් කර තිබුණි.

## 2.5 බැදීම් හා බැරකම්

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 61.13 ක ප්‍රතිපාදනය රු.මිලියන 12.81 කින් ඉක්මවා රු.මිලියන 14.59 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

## 2.6 මුල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මීගස්ආර ගොවිජන සේවා කාරක සභාවේ නිලධාරියෙකු විසින් 2008 වර්ෂය තුළදී මුදල් අයථා ලෙස පරිහරණය කර රු. 320,700 ක මුදලක් අඩුවෙන් බැංකු ගත කර තිබුණි. මෙම මුදලින් 2014 වර්ෂයේදී රු. 122,000 ක මුදලක් පමණක් ආපසු කමිටුවට ගෙවා තිබුණි. මේ සඳහා 2018 අගෝස්තු 30 දින වන විටත් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.7 අනාර්ථික ගනුදෙනු

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2017 අප්‍රේල් මස 07 හා 08 දිනවල පැවැත් වූ අලුත් සහල් මංගල්‍යය සඳහා සමරු ග්‍රන්ථ උත්සවය අවසන් වී දින 20 කට පසුව හා ආරාධනා පත්‍ර දින 38 කට පසු සපයා තිබුණු අතර, ඒ සඳහා දරන ලද වියදම රු. 532,182 ක් විය.

(ආ) 2017 ඔක්තෝබර් 06 දින සිට 2017 ඔක්තෝබර් 12 දින දක්වා වූ කාලය තුල ක්‍රියාත්මක වූ ගොවි සතිය පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම අපේක්ෂාවෙන් පෝස්ටර් මුද්‍රණය කිරීමට 2017 ඔක්තෝබර් 02 දින ඇණවුමක් ලබා දී තිබුණද, ගොවි සතිය අවසන් වී මාසයකට පසුව එනම් 2017 නොවැම්බර් 07 දින පෝස්ටර් සපයා තිබුණු අතර, ඒ සඳහා දරන ලද වියදම රු.740,025 ක් විය.

## 2.8 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව<br>------------------------------------<br>ඡේද අංකය<br>------------- | යොමුගත විෂයය<br>--------------------- |
| --- | --- |
| 3.13 | කැකිරාව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තැන්පත් කර තිබුණු රු. 450,000 ක මුදල හිටපු ගොවිජන ප්‍රාදේශීය නිලධාරියා තමාගේ පෞද්ගලික ගිණුමකට බැර කර තිබීම. |
| 3.15 (ආ) | බලංගොඩ රත්මලවින්න ගොවිජන සේවා මධ්‍යස්ථානයේ සිදු වූ පොහොර වංචාව සම්බන්ධයෙන් කෘෂිකර්ම නිෂ්පාදන සහකාර 09 දෙනෙකු වෙනුවෙන් ආරම්භ කළ විමර්ශන කටයුතු 2016 ජූනි 27 දින අවසන් කර තිබුණත්, රු.1,667,250 ක් වූ තොග ඌනතාවය අය කර ගෙන නොතිබීම. |
| 3.15 (ඉ) | බඩ ඉරිඟු වගා කරන ගොවීන් 5,386 ක් සඳහා ණය ලබාදීමට 2015 වර්ෂයේදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලබා ගත් ණය මුදලින් රු.35,385,267 ක් පියවා නොතිබීම. |
| 3.15 (උ) | අනුරාධපුර කල්ලංචිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නිලධාරීයෙකුගේ මූල්‍ය අක්‍රමිකතා නිසා සිදු වූ රු.364,111 ක් වූ මූල්‍ය සහ තොග ඌනතාවය අය කර ගෙන නොතිබීම. |

## 2.9 කළමනාකරණ දුර්වලතා
--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන පොහොර අක්‍රමිකතා සහ මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් මූලික විමර්ශන 12 ක්, මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ 04 ක් හා විධිමත් විනය පරීක්ෂණ 03 ක් නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගොවිජන සේවා මධ්‍යස්ථාන 10 ක සිදු කරන ලද මුදල් රෙගුලාසි 104 (1) (ආ) ප්‍රකාර පරීක්ෂණ අනුව මුදල් අක්‍රමිකතා, සහනාධාර පොහොර තොග හා අනිකුත් තොග ඌනතාවයක් සම්බන්ධයෙන් නිලධාරීන් 24 දෙනෙකුගෙන් වර්ෂ පහකට වැඩි කාලයක සිට අයවිය යුතු රු.8,560,108 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) ගොවි බැංකු මගින් ගොවීන් වෙත ලබාදී තිබූ රු. 9,626,886,464 ක ණය වර්ග 13 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 1,428,462,224 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

(ඈ) කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කළ 2016 මාර්තු 09 දිනැති අංක 2016/NFS/FCG(1) දරන චක්‍රලේඛයේ 6.3 හා 6.4 වගන්ති ප්‍රකාරව දිවයිනේ සියළුම ගොවිජන සේවා මධ්‍යස්ථානවල 2016 පෙබරවාරි 29 දිනට පැවති වටිනාකම රු.239,272,318

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ |
|---|---|---|---|---|---|

ක් වූ පොහොර සහනාධාර ක්‍රමය යටතේ ඉතිරි වූ තොගය 2016 මාර්තු 31 දිනට පෙර අලෙවි කර රජයේ ගිණුමට මුදල් බැර කරන ලෙස දක්වා තිබුණු නමුත් කිලෝ ග්‍රෑම් 93,830 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අලෙවි කර නොතිබුණු අතර පොහොර අලෙවි කිරීමෙන් ලැබූ රු. 207,741,350 ක මුදලක් ගොවිජන සේවා කමිටු ගිණුම්වල රඳවා ගෙන තිබුණි.

(ඉ) මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලයට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථානවල තිබූ රු.58,229,685 ක් වටිනාකමැති පොහොර තොග ණය පදනමට ගොවීන්ට ලබා දී තිබුණු නමුත් 2018 මාර්තු 31 දින දක්වා එම මුදල් අයකර ගෙන රජයේ ගිණුමට බැර කර නොතිබුණි.

**2.10 මහජනයා වෙත සේවා ඉටු කිරීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව සඳහා වෙබ් අඩවියක් 2011 වර්ෂය තුල නිර්මාණය කර තිබූ නමුත්, ඒ තුළින් මහජනයාට අවශ්‍ය දැනුවත් කිරීම් හා මහජනයාගෙන් පැමිණිලි ලබා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2016 ඔක්තෝබර් 20 දිනැති අංක 24/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේම නිසිපරිදි වෙන් කිරීමට කටයුතු නොකිරීම, අපද්‍රව්‍ය බහාලීම සඳහා සම්මත වර්ණ රටා සහිත කසල බඳුන් ස්ථාපනය නොකිරීම, ආයතනය තුළ පොලිතින් භාවිතය අවම කිරීමට කටයුතු නොකිරීම යන කටයුතු සිදු කර නොතිබුණි.

**2.11 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

-------------------------------------------

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණු අතර, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන තිබුණි.

**2.12 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

---------------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| --------------- | ---------------- | --------------- | ---------------- | ---------------- | ප්‍රතිශතයක් ලෙස ---------------- |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 3,722.78 | 3,719.21 | 3.57 | 0.09 |
| | මුලධන | 655.27 | 600.17 | 55.10 | 8.4 |
| | **එකතුව** | **4,378.05** | **4,319.38** | **58.67** | **1.34** |
| 2014 | පුනරාවර්තන | 4,434.74 | 4,430.07 | 4.67 | 0.11 |
| | මුලධන | 2,040.00 | 2,007.77 | 32.23 | 1.57 |
| | **එකතුව** | **6,474.74** | **6,437.84** | **36.90** | **0.56** |
| 2015 | පුනරාවර්තන | 6,076.09 | 5,988.42 | 87.67 | 1.44 |
| | මුලධන | 2,086.00 | 1,843.57 | 242.43 | 11.62 |
| | **එකතුව** | **8,162.09** | **7,831.99** | **330.10** | **4.04** |
| 2016 | පුනරාවර්තන | 6,920.40 | 6,676.10 | 244.30 | 3.53 |
| | මුලධන | 1,663.00 | 914.22 | 748.78 | 45.03 |
| | **එකතුව** | **8,583.00** | **7,590.22** | **992.78** | **11.57** |
| 2017 | පුනරාවර්තන | 6,752.17 | 6,698.85 | 53.32 | 0.79 |
| | මුලධන | 1,881.68 | 869.04 | 1,012.64 | 53.80 |
| | **එකතුව** | **8,633.85** | **7,567.89** | **1,065.97** | **12.34** |

(අ) විසර්ජන ගිණුම

(i) අධි ප්‍රතිපාදන සලසා තිබීම

වැය විෂයයන් 03 ක් සඳහා එකතුව රු. මිලියන 154 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු. මිලියන 47 පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 36 ක සිට සියයට 78 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

අමාත්‍යාංශ 02 ක්, දෙපාර්තමේන්තු 02 ක්, හා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 4,915 ක, 55.7 ක සහ 2.08 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 1,995.49 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 2,977.29 ක් හෙවත් සියයට 60 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් මාතලේ දිස්ත්‍රික්කයේ සුළු වාරි ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් කර්මාන්ත 11 ක් සඳහා එකතුව රු.23,263,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණද, ඒවා ආරම්භ කර නොතිබුණි.
- කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් දෙපාර්තමේන්තුවට පරිගණක මිලදී ගැනීම සඳහා රු.මිලියන 30 ක් ලබා දී තිබුණු අතර, පරිගණක 200 ක් මිලදී ගෙන ප්‍රධාන කාර්යාලයට පරිගණක 30 ක් ලබා දී තිබුණු අතර, 2018 මැයි 08 දින සිට ඉතිරි පරිගණක 170 ගබඩාවේ තිබුණි. මෙම පරිගණක සඳහා මෘදුකාංග පද්ධතියක් ලබා නොතිබීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි වී තිබුණි.

## 2.13 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 281011 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 285.00 | 284.19 | 192.00 | 234.46 | 600 | 407.06 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

**-------------------------------------------**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 7,733,398 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 05 ක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

**(ආ)** අභ්‍යන්තර ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය ලෙස රු.2,021,473 ක් දක්වා තිබුණු අතර, එම ණය ශේෂය තුළ වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. 1,991,743 ක ශේෂයක් විය.

**2.14 අග්‍රිම ගිණුම**

**---------------**

දෙපාර්තමේන්තුව යටතේ වූ අග්‍රිම ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.323,819 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත අග්‍රිම ශේෂයෙන් රු. 50,800 ක් 2018 ජූනි 05 දින දක්වා නිරවුල් කර නොතිබුණි.

(ආ) 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කාර්යය නිම කර දින 10 ක් ඇතුළත ලබා ගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 26 දෙනෙකුට අවස්ථා 182 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු. 2,255,208 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී දින 33 සිට දින 355 ක කාල පරාසයක ප්‍රමාදයකින් නිරවුල් කර තිබුණි.

(ඇ) පළමුව ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම පියවා නොතිබිය දී එකතුව රු. 3,526,232 ක තවත් තත්කාර්ය අතුරු අග්‍රිම නිලධාරීන් 25 දෙනෙකුට අවස්ථා 242 කදී ලබා දී තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 371(6) ප්‍රකාරව කිසියම් මුදල් වර්ෂයක සඳහන් අග්‍රිමයක් ලෙස දෙන ලද මුදල් වෙනත් මුදල් වර්ෂයකට අයත් ගෙවීම් සඳහා යොදා නොගත යුතු වුවද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් 2017 වර්ෂයේ ලබා ගත් රු.218,330 ක අත්තිකාරම් 2018 වර්ෂයේ පියවා තිබුණු අතර, ඒ අනුව ප්‍රමාද කාලය දින 17 සිට 216 දින දක්වා විය.

(ඉ) නිලධාරීන් 8 දෙනෙකුට අවස්ථා 10 කදී ලබා දුන් රු. 151,430 ක තත්කාර්ය අග්‍රිම අදාළ කාර්යය සිදු නොකර දින 9 සිට දින 321 දක්වා කාලයක් අත රඳවා ගෙන ආපසු මුළු මුදලම තැන්පත් කර තිබුණි.

**2.15 පොදු තැන්පත් ගිණුම**

**-----------------------**

දෙපාර්තමේන්තුව යටතේ පොදු තැන්පත් ගිණුම් 07 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මි. 500 ක් විය. ඒ පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු. මිලියන 35.97 ක් වූ තැන්පතු 954 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2005 වර්ෂයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා පොහොර සහනාධාර වෙනුවෙන් ලබා දී තිබු අත්තිකාරම්වලින් 2015 සිට 2017 දක්වා වර්ෂවල පියවන ලද රු. මිලියන 48.85 ක් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ලබාදී තිබු යතුරුපැදි වෙනුවෙන් 2015 වර්ෂයේදී නිලධාරියාගෙන්

අය කළ මුදලින් රජයේ ගිණුමට බැර කර ඉතිරි වූ රු. මිලියන 0.14 ක් නිරවුල් නොකර 2018 මැයි 30 දින දක්වා තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) 2013 සිට 2017 වර්ෂ දක්වා අළුත් සහල් මංගල්‍ය සඳහා වැය කිරීමට පොදු තැන්පත් ගිණුමේ තිබුණු රු. මිලියන 1.45 ක මුදල උපයෝජනය නොකර කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලබා ගෙන එම උත්සවය සඳහා වියදම් කර තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ තැන්පත් ගිණුම් 04 ක ශේෂය භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තුවේ පොත් අතර රු. මිලියන 1.15 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.16 බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් වී නොතිබුණු එකතුව රු. මිලියන 3.026 ක් වටිනා චෙක්පත් 248 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් කාර්යාල 9 ක හඳුනා නොගත් රු. 571,858 ක ගෙවීම් සහ දිස්ත්‍රික් කාර්යාල 07 ක රු. 532,529 ක හඳුනා නොගත් ලැබීම් හඳුනා ගෙන ගැලපීම් කර නොතිබුණි.

**2.17 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

-------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502 (2) 11 වැනි පරිශිෂ්ටය | යාවත්කාලීන කර නොතිබුණි |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| ඇප ලේඛන | මුදල් රෙගුලාසි 891(1). | පවත්වා නොතිබුණි. |
| වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | පවත්වා නොතිබුණි. |
| ලොග් පොත් | මුදල් රෙගුලාසි 1645 | යාවත්කාලීන කර නොතිබුණි. |

## 2.18 අනුකූල නොවීම්

### 2.18.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| | **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 53 (1) හා (4) වගන්ති | | කෘෂිකාර්මික ඉඩම් ලේඛනය පිළියෙල කිරීමේ වගකීම දෙපාර්තමේන්තුව සතු වුවත්, එසේ කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 1646 | 31,617,210 | රථවාහනවල ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමග ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් පත් ඊ ළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපති වෙත එවිය යුතු වුවත්, වාහන 133 ක ධාවන සටහන් පත් එවා නොතිබුණි. |
| (ඇ) | 2016 සැප්තැම්බර් 08 දිනැති අංක MNPEA 3/2016 (ප්‍රතිශෝධිත) දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය | | තරඟකාරිත්වයෙන් තොරව කොන්ත්‍රාතුවක් ප්‍රදානය කරන විට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවි සංවිධානයක් ලෙස අවුරුදු 2 කට පෙර ලියාපදිංචි වී තිබිය යුතු වුවත් ඊට පටහැනිව 2017 වර්ෂයේ ලියාපදිංචි වූ මාතලේ දිස්ත්‍රික්කයේ ගොවි සංවිධාන 4 කට කර්මාන්ත 5 ක් ප්‍රදානය කර තිබුණි. |

## 2.19 මානව සම්පත් කළමනාකරණය

### 2.19.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාරයභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 6,410.85 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 454,832 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 123 | 70 | 53 |
| (ii) | තෘතියික මට්ටම | 645 | 466 | 179 |
| (iii) | ද්විතියික මට්ටම | 16,065 | 12,976 | 3,089 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,543 | 583 | 960 |
| | එකතුව | 18,376 | 14,095 | 4,281 |

**(අ) අවිධිමත් ලෙස වෙනත් දෙපාර්තමේන්තු වෙත නිදහස් කල මානව සම්පත්**

2017 දෙසැම්බර් 31 දින වන විට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් 08 දෙනෙකු, ආයතන 04 කට නිදහස් කර තිබුණි. සබරගමු පළාත් සභාවට නිදහස් කර තිබූ නිලධාරියා වෙනුවෙන් 2016 ජනවාරි 01 දින සිට 2017 සැප්තැම්බර් 26 දින දක්වා ලැබිය යුතු රු.326,736 ක වැටුප ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) කාර්ය මණ්ඩලය පුහුණු කිරිම**

සමාලෝචිත වර්ෂය තුළදී රු.184,145 ක් වැයකර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 165 දෙනෙකු සඳහා කෘෂිකාර්මික ඉඩම් ලේඛනය යාවත්කාලීන කිරීම පිළිබඳ පුහුණුව ලබාදී තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් කෘෂිකාර්මික ඉඩම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

**2.20 රජයේ නිලධාරීන් ඇප තැබීම**

මුදල් රෙගුලාසි 880 ක ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය අනුව ඇප තැබිය යුතු වුවත්, මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 9,540 ක් ඇප තබා නොතිබුණි.